සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජනවාරි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2019-01-26
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ඔබ, ප්‍රධාන පෙළේ මෘදුකාංග (තොරතුරු තාක්ෂණ යෙදවුම්) සංවර්ධන සමාගමක ව්‍යාපාරික විශ්ලේෂකයෙකු යැයි උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මෙම ව්‍යාපාරය කෙරෙහි සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි බාහිර පරිසරයේ ප්‍රධාන බලවේග (key forces) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) දී ඇති ව්‍යාපාරය කෙරෙහි ඉහත හඳුනා දැක්වූ ප්‍රධාන බලවේගවල බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සමන්ති,** ඉදිකිරීම් කටයුතුවල නිරත සමාගමක් වන, **සීමාසහිත සක්සෙස් එන්ජිනියරිං සමාගමේ** මූල්‍ය ප්‍රකාශන විගණනය කරන කණ්ඩායමේ සාමාජිකාවකි. **සීමාසහිත සක්සෙස් එන්ජිනියරිං සමාගමේ** දේපළ, පිරියත සහ උපකරණ ශේෂය සම්බන්ධයෙන් විගණන පටිපාටි ඉටුකිරීම ඇය වෙත පවරනු ලැබ තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත සක්සෙස් එන්ජිනියරිං සමාගමේ** දේපළ, පිරියත සහ උපකරණවලට අදාලව **සමන්ති** විසින් හඳුනාගැනීමට අවශ්‍ය වන ඕනෑම මූල්‍ය ප්‍රකාශන සැදහුම් (assertions) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC පොදු සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලය, වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයක් වන **SW සහ සමාගම,** ඔවුන්ගේ ව්‍යවස්ථාපිත විගණක වශයෙන් පත්කිරීම පිළිබඳව සලකා බලමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සමාගමක විගණකයෙකු ලෙස පත්කළ නොහැකි හෝ ක්‍රියාකළ නොහැකි තැනැත්තන් දෙදෙනෙකු(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) **සීමාසහිත ABC පොදු සමාගමේ** පළමු විගණක ලෙස පත්වීම බාරගැනීමට පෙර, **SW සහ සමාගම** විසින් ක්‍රියාවට නැංවිය යුතු පටිපාටි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත රෝමා සමාගම** මසා නිමකළ ඇඟළුම් විකිණීමේ ව්‍යාපාරයක නිරත සමාගමකි. කළමනාකරණ අධ්‍යක්ෂ සහ මුදල් සහ පරිපාලන කළමනාකරු යන තැනැත්තන් දෙදෙනාගෙන් **සීමාසහිත රෝමා සමාගමේ** කළමනාකාරීත්වය සමන්විත වෙයි. බලගතු පෞරුෂයකින් හෙබි මැදි වයසේ තැනැත්තෙකු වන කළමනාකරණ අධ්‍යක්ෂ **සීමාසහිත රෝමා සමාගමේ** වර්ෂ 15 කට ආසන්න කාලයක් සේවයේ නියුතුව සිටින අතර ඔහු එහි ඉතාමත් විශ්වාස කටයුතු සේවකයන්ගෙන් කෙනෙකි. කළමනාකරණ අධ්‍යක්ෂකගේ හැකියාවන් පිළිබඳ සම්පූර්ණ විශ්වාසය තබා ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් රැස් නොවන්නා සේම සමාගමේ අධීක්ෂණ කටයුතු කෙරෙහිද ක්‍රියාකාරී උනන්දුවක් නොදක්වයි. තවදුරටත්, අභ්‍යන්තර මූල්‍ය පාලන දුර්වලතාවයන් පිළිබඳ අවධාරණය කරමින් ව්‍යවස්ථාපිත විගණක විසින් යොමුකර ඇති කළමනාකරණ ලිපියේ කරුණු (points of the management letter) කෙරෙහි ප්‍රතිචාර දැක්වීමටද සමාගමේ කළමනාකාරීත්වය ඉතා අඩු උනන්දුවක් දක්වා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වත්කම් සාවද්‍ය පරිහරණය (misappropriation of assets) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) **සීමාසහිත රෝමා සමාගමේ** වංචා පිළිබඳ අවදානම වැඩි කිරීමට තුඩුදෙන තත්ත්වයන් / සිදුවීම් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

නව නිෂ්පාදිතයක් හඳුන්වාදීම සඳහා ව්‍යාපෘතියක ආයෝජනය කිරීමට **සීමාසහිත සෙක්ටෝස් සමාගම** කැමැත්තෙන් සිටී. මෙම ව්‍යාපෘතිය බැංකු ණය මුදලක් හරහා මූල්‍යනය කළයුතු අතර, මෙම ව්‍යාපෘතියෙන් ජනනය වන මුදල් ගලාඒම් සහ මුදල් ගලායෑම් පිළිබඳ විස්තර දැක්වෙන මූල්‍ය පුරෝකතනයක් (financial forecast) පිළියෙළ කරන ලෙස බැංකුව උපදෙස් දී ඇත. එම මූල්‍ය පුරෝකතනය **සීමාසහිත සෙක්ටෝස් සමාගමේ** විගණක විසින් පරීක්ෂාකොට, එම මූල්‍ය පුරෝකතනය පිළිබඳ මතයක් විගණක ලවා නිකුත් කරවා ගැනීමට ද බැංකුවට අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "සහතිකවීමේ කාර්යභාරයක්" (Assurance Engagement) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) සහතිකවීමේ කාර්යභාරයන් සඳහා උදාහරණ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(c) **සීමාසහිත සෙක්ටෝස් සමාගමේ** මූල්‍ය පුරෝකතනය මත කුමන වර්ගයේ සහතිකවීමේ කාර්යභාරයක් ඉටුකරනු ලැබිය යුතුදැයි **තක්සේරු කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) විගණන සේවාදායකයාගේ සහකාර ගණකාධිකාරී විසින් 2018 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේ යෙදී සිටින **රන්දුල,** විගණන කණ්ඩායමේ කණිෂ්ඨ සාමාජිකයෙකි. විගණන සේවාදායකයාට එක් (01) ජංගම ගිණුමක් පමණක් තිබෙන අතර, බැංකු සැසඳුම් ප්‍රකාශ නැවත ඉටුකිරීමට (re-perform) **රන්දුල** අපේක්ෂා නොකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) විගණන පටිපාටීන් වර්ග ලෙස, "පරීක්ෂා කිරීම (inspection)", "නිරීක්ෂණය කිරීමෙන් (observation)" **වෙනස්කොට දක්වන්න**. (ලකුණු 04)

(ii) 2018 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන මත **රන්දුල** විසින් ඉටුකරනු ලැබිය හැකි විගණන පටිපාටි තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) **අමීන්, සීමාසහිත ලෝකල් රීටේලර්ස් සමාගමේ** 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කරන විගණන කණ්ඩායමේ සාමාජිකයෙකි. එහි ප්‍රධාන කාර්යාලය (head office) බද්දට ලබාගත් කොළඹ පිහිටා ඇති ගොඩනැගිල්ලක වන අතර, කුලිය, කාර්තුමය වශයෙන් කලින් ගෙවිය යුතු වේ. කාර්තුවකට කුලිය රු.30,000/- ක් වන අතර, 2018 දී කුලිය ලෙස රු.150,000/- ක් ගෙවන ලදී. 2018 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ කලින් ගෙවූ කුලී ශේෂය රු.30,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කුලී වියදම් සහ 2018 දෙසැම්බර් 31 දිනට කලින් ගෙවූ කුලී වියදම් විගණනය කිරීමේදී **අමීන්** විසින් ඉටුකරනු ලැබිය හැකි විගණන පටිපාටි තුනක්(03) **හඳුනා දක්වන්න**.
(ලකුණු 03)
(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) විගණක විසින් බාහිර සනාථ කිරීමේ (external confirmation) පටිපාටි භාවිත කිරීමේ අරමුණ වන්නේ අදාල සහ විශ්වසනීය විගණන සාක්ෂි ලබාගැනීම සඳහා පටිපාටි සැලසුම් කිරීමත් එම පටිපාටි ඉටු කිරීමත්ය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) බාහිර සනාථ කිරීම් භාවිත කළ හැකි අවස්ථා තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(ii) කළමනාකාරිත්වය විසින් සනාථ කිරීම් ඉල්ලා යැවීම සඳහා විගණකට ඉඩදීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, විගණකට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) අස්තිත්වය සඳහා විගණන කාර්යභාරයේ (audit engagement) කොන්දේසිවලට එකඟත්වය දැක්වීම, සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ සහ පාලනය සඳහා වගකිවයුතු පාර්ශවයන්ගේ (those charged with governance) කාර්යභාරයන්, අස්තිත්වයේ පාලන ව්‍යුහය සහ අදාල නීති හෝ රෙගුලාසි මත රඳා පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

විගණන සේවය යෙදවීමේ ලිපියක ඇතුලත් කළ යුතු කරුණු (points) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

(A) සංවිධාන ඒවායේ අවදානම් කළමනාකරණය කරගත යුතුය. අවදානම් කළමනාකරණ රාමුව (Risk Management Framework) පියවරයන් කිපයකින් සමන්විත වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

අවදානම් කළමනාකරණ රාමුවේ පියවරයන් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(B) **සීමාසහිත ජානදි එක්ස්පෝට් සමාගම (JEL)** පොල්තෙල් නිෂ්පාදනය කර අපනයනය කිරීමේ යෙදී සිටී. **JEL සමාගම,** 500 කට අධික සේවකයන් පිරිසක් සේවයේ යොදවා ඇති අතර, සේවකයන් **JEL** හි විවිධ අංශ අතර පහත සඳහන් පරිදි බෙදා හැර ඇත:

| **අංශය** | **සේවකයින් ගණන** |
|---|---|
| නිෂ්පාදන | 440 + |
| තත්ත්ව පාලන | 16 |
| ඇසුරුම් | 24 |
| ප්‍රවාහන | 12 |
| මූල්‍ය | 10 |
| මානව සම්පත් (HR) | 3 |
| අලෙවිකරණ | 4 |

අලුත් සේවකයෙකු සඳහා අවශ්‍යතාවයක් පැනනැගුණ විට, අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් බඳවා ගැනීමේ අධියාචනා පත්‍රිකාවක් (recruitment requisition form) පුරවා සම්පූර්ණ කොට, අනුමැතිය සඳහා සාමාන්‍යාධිකාරී (General Manager) වෙත යැවිය යුතුය. වැටුප, දීමනා, අවශ්‍ය සුදුසුකම් ආදිය තීරණය කරමින් සතිපතා පැවැත්වෙන මානව සම්පත් රැස්වීමේදී සාමාන්‍යාධිකාරී විසින් එය අනුමත කරයි. ප්‍රචාරණය සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් සමන්විත වූ විධිමත් බඳවා ගැනීමේ ක්‍රියාවලියක් සමාගමෙහි ඇත. මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා ද සමග සේවකයා බඳවා ගැනීම සිදුකළ විගස පත්වීමේ ලිපියක් නිකුත් කරනු ලබන අතර, වැටුප් සැකසීමේ නිලධාරියාට සහ මානව සම්පත් දෙපාර්තමේන්තුවේ පුද්ගලික ලිපිගොනු පවත්වා ගනු ලබන රහස්‍ය ලේකම් වෙතද ඒ පිළිබඳව දන්වනු ලැබේ.

සේවකයන්ගේ සේවයට වාර්තාකරන සහ සේවා ස්ථානයෙන් පිටවී යන අදාල වේලාවන් සටහන් කිරීම සඳහා එක් එක් දෙපාර්තමේන්තුවේ ඇඟිලි සළකුනු තබන යන්ත්‍ර සවිකර තිබේ. නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ විධායක නොවන සේවකයන් සඳහා වැඩකළ පැයගණන මත පදනම්ව ගෙවීම් කරනු ලැබේ. දෙපාර්තමේන්තු අධීක්ෂකයන් සහ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් අතිකාල වැඩ අවශ්‍යතා අනුමත කරනු ලබයි.

අවශ්‍ය නම්, විධායක නොවන සේවකයන්ට, ආදාල මාසයේ 15 වන දිනයට පෙර, වැටුප් අත්තිකාරකම් (salary advances) සඳහා අයදුම්කළ හැකිය. විධායක නොවන සේවකයන්ට සෑම මාසයකදීම 20 දිනට වැටුප් අත්තිකාරම් ලබාගැනීමට ඉඩදෙන අතර, ඊළඟ මාසයේ 10 වන දින වැටුප් ගෙවනු ලබයි. වැටුප් අත්තිකාරම් ලෙස ස්ථිර අත්තිකාරම් ප්‍රමාණයක් ගෙවනු ලබයි. වැටුප් අත්තිකාරම් ද ඇතුළුව සේවකයන්ට අදාල සියලුම ගෙවීම්, බැංකු මාරුකිරීම් (bank transfers) හරහා ගෙවනු ලබයි. සියලුම ව්‍යවස්ථාපිත අඩුකිරීම් (statutory deductions) සිදුකොට අදාල නියාමන අධිකාරීන් (regulatory authorities) වෙත නියමිත වේලාවට ගෙවන බවට වැටුප් සැකසීමේ නිලධාරියා වගබලා ගනී.

වැටුප් ලේඛනය (payroll) සූදානම් වූ විට, ගණකාධිකාරී සහ මූල්‍ය අංශ ප්‍රධානී එය අනුමත කරයි. වරලත් ගණකාධිකාරී ආයතනයක් විසින් අභ්‍යන්තර විගණනය සිදුකරනු ලබන අතර, ඔවුන්ගේ අභ්‍යන්තර පාලන පරීක්ෂාවේ කොටසක් ලෙස නිරන්තරයෙන් වැටුප් ලේඛනයේ ගණනය කිරීම් සහ සේවක වාර්තා පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කෝසෝ [Committee of Sponsoring Organization (COSO)] අනුව, අභ්‍යන්තර පාලන පද්ධතියේ සංරචකයක් වන "අධීක්ෂණය" (Monitoring), යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) **සීමාසහිත ජානදි එක්ස්පෝට් සමාගමේ** වැටුප් සැකසීමේ පද්ධතියට සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ ශක්තීන් (strengths) පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(c) ඉහත (b) හි හඳුනා ඇක්වූ එක් එක් ශක්තීන් (strengths) සඳහා අරමුණක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 05)

(C) තොරතුරු තාක්ෂණ (IT) පාලන, පොදු පාලනවලින් (general controls) සහ යෙදවුම් (application) පාලනවලින් සමන්විතය. පද්ධතියේ ක්‍රියාකාරකම් මත සමස්ත පාලනයන් වශයෙන් රාමුවක් ලෙස තොරතුරු තාක්ෂණ පොදු පාලන ස්ථාපිත වන නමුත්, යෙදවුම් පාලන, පද්ධතිය මඟින් පවත්වා ගනු ලබන යෙදවුම් කෙරෙහි වන නිශ්චිත පාලනයන් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තොරතුරු තාක්ෂණ පොදු පාලන සඳහා උදාහරණ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) යෙදවුම් පාලන සඳහා උදාහරණ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

(A) **මෙන්ඩිස් මහතා,** කොළඹ 3, ගාලු පාර, අංක 69 දරණ ස්ථානයේ ඔහුට හිමි දෙමහල් ගොඩනැගිල්ලක **බීටා ෂූස්** නමැති පාවහන් සාප්පුව පවත්වාගෙන ගියේය. 2018 අගෝස්තු 21 දින සාප්පුව ගින්නෙන් විනාශ වී ගිය අතර එහි තිබූ සියලුම අයිතම විනාශ විය. එම ස්ථානයෙන් පිටත තැනක ගබඩාකර තිබූ පාවහන් තොග භාවිත කරමින් ව්‍යාපාරය නැවත ආරම්භ කළ හැකි බවටත්, විනාශ වූ ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු 2019 සැප්තැම්බර් මාසය වනවිට අවසන් කළ හැකි බවටත් **මෙන්ඩිස් මහතා** විශ්වාසයෙන් සිටී. රක්ෂණ වන්දි ඉල්ලීමක් මූලාරම්භ කර ඇති අතර, රක්ෂණ සමාගම මඟින් ඒ පිළිබඳව කටයුතු සිදුකරමින් පවතී. **බීටා ෂූස් සමාගමේ** ගණකාධිකාරී විසින් 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

**මෙන්ඩිස් මහතා** විසින් දී ඇති තුනී කිරීමේ සැලැස්ම (mitigation plan) අනුව, අඛණ්ඩ පැවැත්ම පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීම යෝග්‍ය බව විගණක විසින් නිර්ණය කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතයකට එළඹීමේදී සලකා බැලීමට අවශ්‍ය කෙරෙන කරුණු (matters) පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(b) **"බීටා ජූස් සමාගමේ"** 2018 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවල විගණකගේ වාර්තාව කෙරෙහි බලපෑ හැකි වෙනත් බලපෑම් (other implications) තිබේදැයි **තක්සේරු කරන්න**. (ලකුණු 05)

(B) පුළුල් පරාසයක සිදුවීම් (circumstances) සහ සම්බන්ධතා (relationships) මගින් මූලික මූලධර්මවලට අනුකූලවීම විභව්‍ය වශයෙන් (potentially) තර්ජනයට ලක්විය හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මූලික මූලධර්මවලට අනුකූලවීමේදී ඇතිවන පහත සඳහන් තර්ජන සඳහා එකකට උදාහරණ දෙක(02) බැගින් **හඳුනා දක්වන්න**:

(a) ස්වයං ඇල්ම මත තර්ජනය (Self-interest threat).

(b) ස්වයං සමාලෝචනය මත තර්ජනය (Self-review threat).

(c) උපදේශන මත තර්ජනය (Advocacy threat). (ලකුණු 06)

(C) ස්වර්ණාභරණ ව්‍යාපාරයේ නියුතුව සිටින **සීමාසහිත හන්ට් සමාගම, ස්ටිච් සහ ස්ටෝම් පාට්නර්ස් (S සහ S) ආයතනයේ** නැවත නැවතත් සේවය ලබාගන්නා (recurring) ව්‍යවස්ථාපිත විගණන සේවාදායකයෙකි. ඔවුන්ගේ ගිණුම් පොත්වල සටහන් කළ යුතු ආදායම් බදු වගකීම ගණනය කිරීම ඇතුළු ආදායම් බදු සම්බන්ධ සියලුම කරුණුවලදී තමන්ට සහාය වන ලෙස **සීමාසහිත හන්ට් සමාගම**, **S සහ S ආයතනයෙන්** මෑතකදී ඉල්ලා සිටියේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත හන්ට් සමාගමේ** බදු උපදේශක වශයෙන් අමතර කාර්යභාරය බාරගැනීම සම්බන්ධයෙන් **S සහ S ආයතනය** විසින් ඉටුකිරීමට අවශ්‍ය කෙරෙන පියවරයන් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) **S සහ S ආයතනය** විසින් එම ආයතනය ඇතුළත තත්ත්වපාලන පද්ධතියක් පිහිටුවා ඇති නම්, "සේවාදායක සම්බන්ධතා බාරගැනීම සහ දිගටම පවත්වාගෙන යාම" පිළිබඳ මූලිකාංගය **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
| --- | --- | --- |
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |